


ආර් එම් ආර් රිසලි අකේන්යා මානින්ගමුව

# යෙන්සොන් සහ මායා පින්සල


## ආර්.එම්.ආර්.රිසලි අකේන්ෂා මානින්ගමුව.

කතෘ


පළමු දිගහැරීම


මහ/මහාමායා බාලිකා විදුහල මහනුවර

7-D


2024-02-08


**ISBN - 978-624- 208- 422-0**

# පිදුම

හිරු,සඳු මෙන් මගේ ලොව ආලෝකමත් කරන

මගේ සුන්දර සිහින එක් කොට

පොතක් ලිවීමට අවස්ථාව ලබා දුන්

මවටත් පියාටත් මෙම පොත ගෞරවයෙන් යුතුව පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන " හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙෂ එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සදහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

ඈත අතීතයේ චීනයේ එක දුප්පත් නගරයක ගොවි යුවළක් ජීවත් වුණා. මේ ගොවි යුවළට දරුවෙක් හිටියා. ඔහුගේ නම යෙන්සොන්. යෙන්සොන් පොඩි කාලයේ ඉඳල ම අවංකයි. වැඩිහිටියන්ට කීකරු හොඳ ළමයෙක්. ඉතින් ඔහොම යෙන්සොන් ටිකෙන් ටික වැඩිලා පාසල් යන වයසට ආවත් ඔහුගේ දෙමව්පියන්ට යෙන්සොන්ව පාසල් යවන්නට මුදල් තිබණේ නැහැ. ඒ වගේම මේ ගම දුප්පත් නිසා පාසලක් තිබුණොත් නැහැ. ඒක නිසා ගොවි යුවළ හිටියේ දුකින්. ඒ කොහොම වුණාත් යෙන්සොන් නම් දුක් වුණේ නැහැ. ඔහු අම්මයි, තාත්තයි ළඟට ගිහින් "අම්මේ,තාත්තේ දුක් වෙන්න එපා. මම දුක් වෙන්නේ නැහැ. මම කැමතියි ඔයාලට උදවු කරගෙන ම ජීවත් වෙන්න"යි කියලා කිවුවා. ඊට පස්සෙ මේ ගොවි යුවළත් කරන්නට දෙයක් තිබුණේ නැති නිසා ඔහුව නිවසේ තියා ගත්තා. එදා ඉඳන් යෙන්සොන් එයාගේ අම්මාගෙයි, තාත්තාගෙයි ගෙවත්තේ ඔවුන්ට වගා නරන්නට උදවු කරමින් ජීවත් වුණා.



හැබැයි යෙන්සොන්ට වගා කරන එක ලේසි වුණේ නැහැ. ඒ මොකද කිවුවොත්, යෙන්සොන්ගෙ ගමට ජලය ලබා ගන්නට ඇළක්වත්, දොළක්වත් තිබුණේ නැහැ. ඒක නිසා ගමේ මිනිස්සුන්ට වතුර ගේන්න ඈත තිබුණු කැලයකට යන්න සිදු වුණා. ඒ වගේ ම ඔවුන්ට ජල භාජනත් කර තබාගෙන පයින් ම තමයි යන්නට සිද්ධ වුණේ. යෙන්සොන්ටත් එයාගේ මව හා

පියා ගෙවත්තේ වැඩ කරනකොට වගාවට දාන්න ජලය අරන් එන්න වුණා. එයාගේ ගමට වතුර ලබා ගන්න ක්‍රමයක් තිබුණේ නැති නිසා යෙන්සොන්ට ඒක ලොකු ප්‍රශ්නයක් වුණා. ඉතින් යෙන්සොන් එයාගේ ප්‍රශ්නය ගැන අනිත් අයගෙන් ඇසුවත් ඒකට පිළිතුරක් ලැබුණේ නැහැ. යෙන්සොන් ලොකු වෙලා ගමට ඇළ පාරක් හදන්නට අදිටන් කර ගත්තා. කාලය ගත වෙනකොට යෙන්සොන් ලොකු වෙලා ශක්තිමත් තරුණයක් බවට පත් වුණා. දැන් එයාගෙ අම්මයි තාත්තයි මහලු නිසා එයාලා විවිධ වැඩවලට යොදා ගැනීම නරක වැඩක් යයි සිතපු යෙන්සොන් ගෙදර වැඩයි අනිත් වැඩයි කැමැත්තෙන් ම භාරගෙන මව්පියන්ට උපස්ථාන කරමින් ජීවත් වුණා. ඔය අතවාරයේ දී ගමේ නායකයා මිය ගියා. ඔහුට අවසාන ගෞරව දැක්වීමට ගිය යෙන්සොන් එදා හවස කැලයට ගොස් වතුර ගෙන නැවත එනවිට වැලක පැටලුණු හාවෙක් දැක්කා. යෙන්සොන්ට ඌ ගැන අනුකම්පාවක් ඇති වෙලා හාවා එයින් නිදහස් කර ගත්තා. එක පාරටම හාවා "ආහා.... කොහොමද ඔයාට. ස්තූතියි මාව බේරගත්තාට." කියලා කිවුවා. යෙන්සොන් බය වෙලා මෙහෙම කිවුවා. "මහ පුදුමයක් ! මම සත්තු කතා කරනවා කියලා දැනගෙන හිටියේ නැහැ. ඔයා අපේ ලෝකය යටත් කරගන්න

ආව මායාකාරයෙක් නේද?" කියලා යෙන්සොන් ඇහුවා. "ඒයි.... මට ඔහොම අගෞරව කරන්න එපා. මම හොඳ මායා හාවෙක්. මාව බේරගත්ත ඔයාට මම තෑග්ගක් දෙනවා. මම ඔයාට මගෙ බූල් පිරුණු හමෙන් බූල් ටිකක් දෙන්නම්. ඒවා ගෙදර අරන් ගිහින් පින්සලක් හදන්න. හැබැයි මේකට හදන්න ගන්න ඕන ඕක් ලීයක්. ඒක හොඳින් පාවිච්චි කරන්න." මෙහෙම කියලා මේ මායා හාවා යෙන්සොන්ට බූල් ටිකක් දීලා යන්න ගියා. බූල් ටික පන් මල්ලකට දා ගත්ත යෙන්සොන් නිවස වෙත යන ගමන් ඕක් අත්තකුත් රැගෙන ගියා. ඊට පසු දින ම යෙන්සොන් පින්සල හදන්නට පටන් ගත්තා. ඒ වගේ ම ඔහු පාට වර්ගත් හදා ගත්තා. පින්සල හැදුවාට පස්සෙ යෙන්සොන් එයාගෙ කාමරයට ගිහින් පින්සලකින් චිත්‍ර අඳිනවාට වඩා දෙයක් කරන්නට බැරි නිසා කොලයක ඇපල් ගෙඩියක් ඇන්දා. එක පාරටම ඒක ඇත්තක් බවට පත් වුණා. ඔහු කෙසෙල් ගෙඩියක් ඇන්දා. ඒකත් අර වගේම ඇත්තක් බවට පත් වුණා. ඒ වෙලාවෙ යෙන්සොන්ට මතක් වුණේ එයාගේ අධිෂ්ඨානය. ඔහු ඉක්මනින් මායා පින්සලයි, පාටයි,කොලයකුයි අරගෙන ගමේ සිතියමක් අරගන්නට ගියේ ගමේ නායකතුමාගේ ගෙදරට. ඒ වුණාට යෙන්සොන්ට වැඩි දුරක් යන්නට බැරි වුණා. ඒ මොකද කිවුවොත්

මිනිස්සු ගොඩක් රොක් වෙලා හිටපු තැනකින් යෙන්සොන් යනකොට යෙන්සොන්ව දැකපු මිනිස්සු එයාව එතන  මැදට අරගෙන ගියා. ඒ වෙලාවෙදි තමයි යෙන්සොන් දැන ගත්තේ එයා ගමේ නායකයා විදිහට තෝරාගෙන කියලා. ඒක ඇහුණු යෙන්සොන්ට ලොකු සතුටක් දැනුණා. ඊට පස්සෙ එයා තමන් හදන්න යන ඇළ ගැන වගේම එයාට වුණ සිද්ධිය ගැනත් ගමේ මිනිස්සුට කිවුවා. මේක අහපු අය හිතුවේ යෙන්සොන්ට පිස්සු කියලා හිතුවා. ඒ වුණාට එතන හිටපු ගමේ කවුරුත් ගෞරව කරපු මහල්ලෙක් යෙන්සොන්ට මේ වැඩේ කරන්න අවස්ථාවක් දෙන්න කිවුවා.



ඊට පස්සේ යෙන්සොන් ගමේ මනුස්සයෙක්ට කියලා ගමේ සිතියමක් ගෙන්වා ගත්තා. ඊට පස්සේ කැලයේ උල්පතකින් පටන් ගන්න වතුර පාරක් දික් කරලා ගම මැදින් ඇළක් ඇන්දා. මොහොතකින් ඒක ඇත්ත ඇළක් බවට පත්  වෙලා ගම මැදින් ගලන්නට පටන් ගත්තා. මේක දැකපු මිනිස්සු සතුටට පත් වෙලා යෙන්සොන්ව ගමේ නායකයා විදිහට පත් කර ගත්තා. එදා ඉඳන් යෙන්සොන් හොඳින් ගම පාලනය  කරමින් ජීවත් වුණා.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්